# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# පුරප්පාඩු දැන්වීමයි

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව අඩු ආදායම්ලාභීන් සඳහා නීති ආධාර ලබාදීම මූලික කරගනිමින් 1978 අංක 27 දරන නීති ආධාර පනත මගින් සංස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.**

## සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) - තනතුරු 01

**සුදුසුකම්**

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය හෝ සමාජ විද්‍යාව හෝ කළමනාකරණය හෝ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම සමග
- උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.
- 2020.07.01 දිනට වයස අවුරුදු 32 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**රැකියාවේ වගකීම**

පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සාධනය, විධානය හෝ අණදීම කළමනාකරණය හා ඒ සම්බන්ධ තීරණ ගැනීමට අදාළ කාර්යයන් ඇතුළත් වූද ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ත කාර්යභාරයේ අන්තර්ගත කාර්යයන් අතර කොටසක් වශයෙන් ගැනිය හැකි වූද, කාර්යයන් අතුරින් ආයතනයේ ඉහළ විධායක නිලධාරියාගේ කාර්ය භාරයට උපස්ථම්භක හෝ පහසුකාරක වන පරිදි තනතුරට විශේෂිතව පවරා දෙනු ලබන කාර්ය භාරයන් වේ.

**වැටුප් කේතය**

MM -1-3-රු.55,925-10X 1375-15 X 1910 - 98325 + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි) + EPF/ETF

(ඔබ දැනට රාජ්‍ය සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක සේවය කරන්නේ නම් එකී ආයතන ප්‍රධානියා මගින් ඔබගේ අයදුම්පත පහත ලිපිනයට යොමු කළ යුතු වේ.)

## තනතුර -නීති නිලධාරී (සම්පූර්ණ පුරප්පාඩු - 05යි)

**(කොළඹ - 01/කඩවත -01 / මුලතිවු -01 / කිලිනොච්චි 01 / බදුල්ල 01)**

**සුදුසුකම්**

- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසු වසර තුන(03)ක ක්‍රියාකාරී වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.
- 2020.07.01 දිනට වයස අවුරුදු 28 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයින්නේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**රැකියාවේ වගකීම**

නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥයෙකු වශයෙන් අධිකරණයේ කටයුතු කිරීම හා කොමිෂන් සභාව විසින් නීති නිලධාරියෙකු වශයෙන් පවරා දෙනු ලබන සියලු රාජකාරී ඉටු කිරීම.

**වැටුප් කේතය**

MM -1-1- රු.53,175 -10 X 1375-15 X 1910 -95,575 + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි) +EPF/ETF

## තනතුරු - කළමනාකරණ සහකාර (පුරප්පාඩු 05යි)

**කොළඹ ප්‍රධාන කාර්යාලය (උසාවි ලිපිකරු) - 01**

**කන්තලේ -01 / කැකිරාව 01/, පුත්තලම 01 / වැලිමඩ 01**

**අවශ්‍ය සුදුසුකම්**

1.) 2020.07.01 දිනට වයස අවුරු 18 නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු අතර, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2.) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිතය සහ සිංහල හෝ දෙමළ යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් සමත්ව තිබීම.

3.) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය) හැර සමත්ව තිබීම.

4.) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

5.) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

6.) පරිගණක සාක්ෂරතාවය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. (සිංහල හෝ දෙමළ / ඉංග්‍රීසි)

7.) නීතිඥවරයෙකු යටතේ ලිපිකරුවෙකු වශයෙන් සේවා පළපුරුද්දක් ඇත්නම් එය අතිරේක සුදුසුකම් ලෙස සලකනු ලැබේ.

**රැකියාවේ වගකීම**

ආයතනයන්හි විධායක හා පරිපාලන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/ හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නා වූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්වීම් බලධාරියා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් සේවකයින් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

**වැටුප් කේතය**

MA 1-2:-(27910-10 X 300-78350-12 X 600-12X710-49080) + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි. + EPF/ETF

(ලිඛිත පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

(ඉහත සියලු තනතුරු සඳහා බඳවා ගැනීමෙන් පසු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා අදාළ කාලයන්හිදී පෙනී සිටිය යුතු වේ)

ඉහත තනතුරු සඳහා අයදුම්පත් 2020 අගෝස්තු 31 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කරන්න. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ විසින් අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න

**ලිපිනය -:**


**සභාපති,**

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව,**

**මහාධිකරණ සංකීර්ණය,**

**අළුත්කඩේ, කොළඹ 12.**